ආයතනයේ නම-ගම්පොල නගර සභාව

අපගේ දැක්ම- සලසන සෙත පුරයේ දනවෙත ගඟසිරිපුරයෙහි

අපගේ මෙහෙවර-“ පුරවැසි දනගේ හිත සුව උදෙසා- නිරෝගී බව රකින සුව සහන සේවාද, හරිත ගහ කොළ පිරුණු සුවදායි දසුනක්ද, ගෙවන්නට දහසක් යොදුන් ඉදි කෙරෙන මං පෙත්ද , බිඳින්නට අඳුර - වීථී පහන් එළිද, පවසට දියවරද, පුරය ක්‍රමවත් කරන ගොඩනැඟිලි සැලසුම්ද, දැන උගත්කම් පිණිස දැනුම් පොත් ශාලාද, ඔබේ සහයද රැගෙන නිරන්තර සලස්වා දීම, අපගේ මෙහෙවරයි ”

## ගම්පොල නගර සභාවේ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය

| අනු අංකය | සපයනු ලබන සේවාවන් | අවශ්‍ය ලේඛන | සේවාව ඉටු කරදීම සදහා ගතවන කාලය | සෘජුව සම්බන්ධ වන නිලධාරියා හා දුරකථන අංකය | හමුවිය යුතු නිලධාරියා | අදාල ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 01 | වෙළඳ බලපත්‍රයක් ලබාගැනීම | ➢ ස්ථානයේ සින්නක්කර බදු හෝ කුලී අයිතිය තහවුරු කරන ලේඛනය<br>➢ සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය<br>➢ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් වන විට වලංගු පරිසර ආරක්ෂණ බලපත්‍රයේ සහතික කළ පිටපතක් | දින 14 | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ➢ අංශ ප්‍රධානි(අදායම්)<br>➢ මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>➢ විෂය නිළධාරි | සභාවෙන් දැනුම් දෙනු ලබන නිවේදනයේ සඳහන් මුදල |
| 02 | වරිපනම් ලේඛනයේ දේපල හිමිකරුවෙකුගේ නම වෙනස් කර ගැනීම. | ➢ සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය(අයදුම් පත්‍රය සරප් වෙත රු 200.00 ක් ගෙවා ලබාගත හැක.)<br>➢ ඔප්පුවේ පිටපත<br>➢ පිඹුරු පිටපත<br>➢ පෙළපත් සටහන(පෙළපත් සටහන නිවැරදි බවට නොතාරිස්වරයෙකු මගින් එම අයදුම්පතෙහි සහතික කරවා ගැනීම | දින 14 | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ➢ ප්‍රධාන ආදායම් පරීක්ෂක<br>➢ විෂය නිලධාරි | සභාවෙන් දැනුම් දෙනු ලබන නිවේදනයේ සඳහන් මුදල |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 03 | වරිපනම් අංකයක් ලබා ගැනීම | ➢ වරිපනම් අංකය ලබා ගත යුතු ඉඩම් කොටස පිළිබඳව ඉල්ලීම් ලිපිය<br>➢ ඔප්පු පිටපත<br>➢ පිඹුරු පිටපත<br>➢ ගොඩනැගිල්ලක් ඉදිරිපත් කර තිබේනම් අනුමත සැලැස්ම<br>➢ මුල් ඉඩම බෙදා වෙන් කර තිබේ නම් එවැනි අවස්ථාවක එම ඉඩම අනුබෙදුම් කිරීම සඳහා නගර සභාවෙන් අනුමැතිය ලබාගත් බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන්න | දින 14 | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ➢ අංශ ප්‍රධානි(අදායම්)<br>➢ ප්‍රධාන ආදායම් පරීක්ෂක<br>➢ වරිපනම් කොට්ඨාසය භාර ආදායම් පරීක්ෂක<br>➢ විෂය නිලධාරි | සභාවෙන් දැනුම් දෙනු ලබන නිවේදනයේ සඳහන් මුදල |
| 04 | ව්‍යාපාර බද්ද අය කර ගැනීම | ➢ සභාව විසින් තමන් වෙත එවනු ලැබූ ව්‍යාපාර බදු නිවේදනය | දින 01 | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ➢ ආදායම් පරීක්ෂක | ➢ බදු නිවේදනයේ සඳහන් මුදල |
| 05 | කර්මාන්ත බද්ද අය කර ගැනීම | ➢ සභාව විසින් තමන් වෙත එවනු ලැබූ කර්මාන්ත බදු නිවේදනය | දින 01 | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ➢ ආදායම් පරීක්ෂක | ➢ බදු නිවේදනයේ සඳහන් මුදල |
| 06 | දේපළ හිමිකම ලියා පදිංචි කිරීම හා සංශෝධනය කිරීම | ➢ නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය (පිටපත් 2 කින් යුක්ත ව)<br>➢ නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඔප්පුවේ පිටපත් 2 ක් | දින 05 | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ➢ ආදායම් පරීක්ෂක<br>➢ විෂය නිලධාරි | ➢ ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු. 250.00. |
| 07 | ඇතැම් ඉඩම් විකිණීම මත බදු | සභාව විසින් තමන් වෙත එවනු ලැබූ ඇතැම්ඉඩම් විකිණීම මත බදු නිවේදනය | විනාඩි 15 | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ➢ විෂය භාර නිලධාරි | ඉඩම විකුණන ලද මුදල් වටිනාකමෙන් සියයට එක(1%) ක් |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 08 | ප්‍රචාරක බැනරයක් කටවුටයක් ස්ථිර දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය සඳහා අවසර ලබා ගැනීම. | ➢ තම අවශ්‍යතාවය සඳහන් කර එහි ප්‍රචාරක මාධ්‍ය ප්‍රමාණය ප්‍රචාරය කිරීමට අවශ්‍ය ස්ථානය ද ඇතුලත් කර ලිඛිත ඉල්ලීම.<br>➢ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ස්ථානයක නම් එම අධිකාරියෙන් අවසර ගත් ලියවිලි<br>➢ කිසියම් මාර්ගයක රක්ෂිතයක සවි කර ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් පුවරුවක් වන විට, අදාළ ප්‍රචාරක දැන්වීම් පුවරුව ප්‍රදර්ශනය කරන ස්ථානය අයත් වන පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ ප්‍රධානියා විසින් නිකුත් කළ ලිපියේ මුල් පිටපත<br>➢ ඉල්ලුම්කරු ඉඩමේ අයිතිකරු නොවන විට, දැන්වීම ප්‍රදර්ශනය කරනු ලබන ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ අයිතිකරු විසින් ඒ සඳහා ඉඩ දෙන ලද බව ප්‍රකාශිත ලිපියේ මුල් පිටපත<br>➢ නාගරික සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් පුවරුවක් වන විට, 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝගවල 104 වන නියෝගය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් හෝ සභාව විසින් අනුමත කළ බලපත්‍රයේ සහතික කළ පිටපත | දින 03 | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ➢ ආදායම් පරීක්ෂක<br>➢ විෂය නිලධාරි | ➢ අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති පරිදි දැන්වීමේ වර්ග ඵලය මත අවසර පත්‍ර ගාස්තුව |
| 09 | විනෝද බද්ද අය කර ගැනීම සහ විනෝද බද්දෙන් නිදහස් කිරීම | 1 විනෝද බද්ද අය කර ගැනීමේ කාර්යය සඳහා -<br>i. අලෙවි කිරීම සඳහා සූදානම් කළ මුද්‍රිත ප්‍රවේශ පත්‍ර;<br>ii. අන්තර්ජාලය ඔස්සේ අලෙවි කිරීමට යෝජිත ප්‍රවේශ පත්‍රවල විද්‍යුත් මුද්‍රාව තැබීම සඳහා පරිගණක | දින 02<br>2. ඇමුණුම 02 භාර දුන් දින සිට දින 7 | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ➢ ආදායම් පරීක්ෂක.<br>➢ විෂය නිලධාරි | එක් එක් ප්‍රවේශ පත්‍රයේ මුහුණත වටිනාකමෙන්<br>0-200 ටිකට් පත් සඳහා 10%<br>200-500 ටිකට් පත් සඳහා 12%<br>500 වැඩි ටිකට් පත් සඳහා |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | මුර පදය<br>2. විනෝද බද්දෙන් නිදහස් කිරීමකට අදාළ වන විට, ඉහත 1 හි පරිදි ක්‍රියා කරමින් -<br>i. අලෙවි කිරීමට යෝජිත ප්‍රවේශ පත්‍රවල වටිනාකම අනුව, පළමුව විනෝද බද්දට සමාන මුදල සභාවේ තැන්පත් කළ යුතු ය;<br>ii. විනෝද බද්ද තැන්පත් කරන අවස්ථාවේ දී ම,විනෝද කාර්යයේ ආදායම් හා වියදම් ඇස්තමේන්තුව<br>iii. විනෝද කාර්යය අවසන් වී දින 30 කට පෙර විනෝද කාර්යයේ සත්‍ය ආදායම් හා වියදම් විස්තරය | | | | 15%<br>(අමාත්‍යවරයා විසින් අනුමත කළ, සභා සම්මතය අනුව මේ ප්‍රතිශතය නියම වේ) |
| 10 | අවමංගල්‍ය උත්සව ශාලා කුලියට දීම | ➢ නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය<br>➢ මියගිය අයගේ මරණ සහතිකය<br>➢ මියගිය අයගේ ජාතික හැඳුනුම් පත<br>➢ ආදාහානාගාරය වෙන් කිරීමට පැමිණෙන පුද්ගලයාගේ ජාතික හැඳුනුම් පත | ශාලාව වෙන් කිරීම විනාඩි 15 | පෙරටු කාර්යාල නිලධාරි<br>081<br>2352275 | ➢ තාක්ෂණ නිලධාරි<br>➢ මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>➢ විෂය නිලධාරි | 01 ශාලා ගාස්තුව<br>රු.15000.00<br>02 .ආරක්ෂිත ඇපය<br>රු.5000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 11 | නගර ශාලා කුලියට දීම. | ➢ නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය | ශාලාව වෙන් කිරීම විනාඩි 15 | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ➢ තාක්ෂණ නිලධාරි<br>➢ විෂය නිලධාරි | 01 ශාලා ගාස්තුව රු.7500.00<br>02 .ආරක්ෂිත ඇපය රු.5000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 12 | ක්‍රීඩා පිටි කුලියට දීම | ➢ නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය | ශාලාව වෙන් කිරීම විනාඩි 15 | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ➢ තාක්ෂණ නිලධාරි<br>➢ විෂය නිලධාරි | 01 ශාලා ගාස්තුව රු12000.00<br>02 .ආරක්ෂිත ඇපය රු.5000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 13 | ආදාහනාගාරය වෙන් කරවා ගැනීම | ➢ නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය<br>➢ ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ පිටපතක් (පරීක්ෂා කර බැලීමට මුල් පිටපත අවශ්‍ය වේ)<br>➢ මියගිය තැනැත්තාගේ මරණ සහතිකයේ පිටපතක් (පරීක්ෂා කර බැලීම සඳහා මුල් පිටපත අවශ්‍ය වේ. විදේශයක දී සිදු වූ මරණයක් වන විට, ඒ රටේ දී නිකුත් කළ මරණ සහතිකය - ඉංග්‍රීසි භාෂාවෙන් නොවන විට, ඉංග්‍රීසි පරිවර්තනයක් සමග) | විනාඩි 15 | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | රාජකාරි වේලාවෙන් පසු අවස්ථාවක් වන විට නම් කළ නිලධාරියා | ➢ බල ප්‍රදේශය ඇතුළත රු 10000.00<br>➢ පිටත රු 12000.00<br><br>සවස 6 න් පසු<br><br>➢ බල ප්‍රදේශය ඇතුළත රු 12000.00<br>➢ පිටත රු 14000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 14 | ගොඩනැගිලි සැලසුම්පතක් අනුමත කරවා ගැනීම. | ➢ සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය( සරප් වෙත අදාල මුදල් ගෙවීමෙන් පසු ඔබට ගොඩනැගිලි අයදුම්පත ලබා ගත හැක)<br>➢ සුදුසුකම්ලත් පුද්ගලයකුගේ නිර්දේශය සහිත ගොඩනැගිලි සැලැස්මේ පිටපත් 03ක්,<br>➢ අනුබෙදුම් කර ඇති ඉඩමක් නම් අනුමත අනුබෙදුමේ ඡායා පිටපතක්,<br>➢ නිරවුල් ඔප්පුවේ ඡායා පිටපතක්,<br>➢ ඉඩම් අනුබෙදුමේ කොන්දේසි වලට අනුකූලව නිර්දේශ ලිපි වල ඡායා පිටපත්,<br>➢ නාය යෑමේ අවධානමට අයත් ප්‍රදේශයක් නම් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ යෝග්‍යතා වාර්තාව හා එහි ඡායා පිටපත<br>➢ කුඹුරු ඉඩමක් නම් කුඹුරු ඉඩම ගොඩ කිරීමට අවසර ලත් ලිපිය<br>➢ අයදුම්කරුගේ හා ඉඩම් හිමිකරුගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත<br>➢ ඉඩමට ප්‍රවේශවන මාර්ග සිතියම<br>➢ වර්ග ප්‍රමාණය අනුව පෙරසැරි ගාස්තුව සරප් වෙත ගෙවා ලැබූ ලදුපත.(පෙරසැරි ගාස්තු කාර්යාලයේ ප්‍රදර්ශනය කර ඇත) | දින 14 | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ➢ ලේකම්<br>➢ ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරි<br>➢ තාක්ෂණ නිලධාරි<br>➢ විෂයභාර නිලධාරි | ➢ ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු .850.00. . .<br>➢ පෙරසැරි ගාස්තුව (සැලසුම් හා සංවර්ධන නියෝගවල 2 උපලේඛනයේ සඳහන් සංවර්ධනයේ ස්වභාවය අනුව වන ගාස්තුව) |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 15 | ඉඩම් අනුබෙදුමක් සදහා අවසර ලබාගැනීම. | ➢ සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය(අයදුම් පත්‍රය සරජ් වෙත මුදල් ගෙවා ලබාගත හැක.)<br>➢ මූලික පිඹුර හා එහි ඡායා පිටපතක්<br>➢ 1:1000 පරිමාණයට අඳින ලද අනුබෙදුමට අදාල මිනින්දෝරු සැලැස්ම හා එහි ඡායා පිටපත් 02,<br>➢ නිරවුල් ඔප්පුව හා ඔප්පුවේ ඡායා පිටපත<br>➢ නාය යෑමේ අවධානමට අයත් ප්‍රදේශයක් නම් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ යෝග්‍යතා වාර්තාව හා එහි ඡායා පිටපත<br>➢ කුඹුරු ඉඩම් සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශය,<br>➢ අයදුම්කරුගේ හා ඉඩම් හිමිකරුගේ ජාතික හැදුනුම්පතේ ඡායා පිටපත<br>➢ ඉඩම සඳහා මාර්ග සිතියම<br>➢ වර්ග ප්‍රමාණය අනුව පෙරසැරි ගාස්තුව සරජ් වෙත ගෙවා ලැබූ ලදුපත.(පෙරසැරි ගාස්තු කාර්යාලයේ ප්‍රදර්ශනය කර ඇත) | දින 14 | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ගරු සභාපති<br>ලේකම්<br>වැඩ අධිකාරි (සැලසුම් අංශය)<br>තාක්‍ෂණ නිලධාරි<br>විෂයභාර නිලධාරි | ➢ ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු 150.00<br>➢ පෙරසැරි ගාස්තුව (සැලසුම් හා සංවර්ධන නියෝගවල 2 උපලේඛනයේ සඳහන් සංවර්ධනයේ ස්වභාවය අනුව වන ගාස්තුව) |
| 16 | අනුකූලතා සහතිකයක් ලබා ගැනීම | ➢ සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය(අයදුම් පත්‍රය සරජ් වෙත මුදල් ගෙවා ලබාගත හැක.)<br>➢ සංවර්ධන බලපත්‍රයේ මුල් පිටපත( සංවර්ධන බලපත්‍රයේ වලංගු වන කාලය වසරක් වන අතර, එම කාලය ඉකුත් වී ඇත්නම්, කාලය දීර්ඝ කිරීමේ කටයුතු කරගත යුතුය.)<br>➢ අනකූලතා සහතිකය ලබා ගැනීම සඳහා අදාළ බිම් ප්‍රමාණය අනුව මුදල් ගෙවූ ලදුපත. | අනුමත කළ සැලැස්ම අනුවම ඉදිකර ඇත්නම් සති 02 | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ගරු සභාපති<br>ලේකම්<br>වැඩ අධිකාරි (සැලසුම් අංශය)<br>තාක්‍ෂණ නිලධාරි<br>විෂයභාර නිලධාරි | ➢ ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු 150.00<br>➢ පෙරසැරි ගාස්තුව (සැලසුම් හා සංවර්ධන නියෝගවල 2 උපලේඛනයේ සඳහන් සංවර්ධනයේ ස්වභාවය අනුව වන ගාස්තුව |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| 17 | අනවසර ඉදිකිරීම් සඳහා ආවරණ අනුමතය දීම | ➢ නාගරික සංවර්ධන ප්‍රදේශයක් වන විට, 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝගවල 1 වන උපලේඛනයේ ඉල්ලුම් පත්‍රය හෝ වෙනත් ප්‍රදේශයක් වන විට, පෙරටු කාර්යාලයෙන් ලබා ගත් ඉල්ලුම් පත්‍රය.<br>➢ ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ සහතික කරන ලද පිටපතක්<br>➢ සුදුසුකම් ලත් තැනැත්තකු විසින් සහතික කරන ලද ගොඩනැගිලි සැලැස්මේ පිටපත් 05 (ඉල්ලීමේ ස්වභාවය අනුව අදාළ වන සුදුසුකම් ලත් තැනැත්තා කවරෙක් ද යන්න සභාවේ වෙබ් අඩවියෙන් හෝ පෙරටු කාර්යාලයෙන් දැන ගැනීමට හැකි ය)<br>➢ ගොඩනැගිල්ල ඉදි කරනු ලබන ඉඩමේ අනුමත මිනින්දෝරු සැලැස්මේ පිටපතක් (*නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ ප්‍රකාශිත නාගරික සංවර්ධන ප්‍රදේශවලට පමණක් අදාළ වේ*)<br>➢ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ස්වභාවය අනුව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ආයතනවලින් නිකුත් කරනු ලබන සහතික<br>➢ ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් | දින 28 | පෙරටු කාර්යාල නිලධාරී 081-2352275 | ගරු සභාපති<br>ලේකම්<br>වැඩ අධිකාරි (සැලසුම් අංශය)<br>තාක්ෂණ නිලධාරි<br>විෂයභාර නිලධාරි | ➢ ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු .850.00.<br>➢ පෙරසැරි ගාස්තුව (සැලසුම් හා සංවර්ධන නියෝගවල 2 උපලේඛනයේ සඳහන් සංවර්ධනයේ ස්වභාවය අනුව වන ගාස්තුව |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය<br>➢ ඉඩම පිහිටි ස්ථානයට පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා අවට පිහිටීම ද පෙන්නුම් කරන පරිදි අඳින ලද දළ රූප සටහනක්<br>➢ නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉඩමේ ඔප්පුවේ පිටපතක් | | | | |
| 18 | සංවර්ධන බලපත්‍රයක වලංගු කාලය දීර්ඝ කිරීම | ➢ නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය<br>➢ අනුමත කළ සංවර්ධන සැලැස්මේ මුල් පිටපත<br>➢ නිකුත් කළ සංවර්ධන බලපත්‍රයේ පිටපත.<br>➢ ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ දෙපැත්තේ සහතික කළ පිටපතක්.<br>➢ ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩමේ හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය | දින 07 | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ගරු සභාපති<br><br>ලේකම්<br><br>වැඩ අධිකාරි (සැලසුම් අංශය)<br><br>තාක්‍ෂණ නිලධාරි<br><br>විෂයභාර නිලධාරි | කාලය දීර්ඝ කිරීම වර්ෂයක් සඳහා රු 5000.00 |
| 19 | පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගැනීම. | ➢ සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය | දින 01 | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ➢ ලේකම්<br>➢ පුස්තකාලයාධිපති<br>➢ පුස්තකාල සහායකවරු | ➢ ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු 20.00<br>නගර සභා බල ප්‍රදේශය තුළ වැඩිහිටි සාමාජික ගාස්තුව රු.15000.<br>ඇප ගාස්තුව - රු 200.00<br>සේවා ගාස්තුව රු 200.00<br><br>බල ප්‍ර දේශයේ සිට සැතපුම් 10 ක් ඇතුලත සාමාජික ගාස්තුව රු.200 00.<br><br>ඇප ගාස්තුව රු ,300.00<br>සේවා ගාස්තුව රු 200.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | නගර සභා බල ප්‍රදේශය තුළ<br>ළමා සාමාජික ගාස්තුව රු100.00.කි.<br>ඇප ගාස්තුව රු ,100.00<br><br>සේවා ගාස්තුව .රු-100..00<br><br>නගර සීමාවේ සිට සැතපුම් 10 ඇතුලත<br>ළමා සාමාජික ගාස්තුව රු 150.00.කි.<br>ඇප ගාස්තුව -රු ,200.00<br>සේවා ගාස්තුව රු 150.00 |
| 20 | වීථිරේඛා අයිතිය පිළිබඳ හා නොපවරා ගැනීමේ සහතිකපත් නිකුත් කිරිම | ➢ සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය(මෙය කර්මාන්ත අංශයෙන් ලබා ගත හැක.)<br>➢ ඉඩමට අදාල ඔප්පුවේ පිටපත.<br>➢ පිඹුරු පිටපත(Plan)<br>➢ ආදයම් අංශයෙන් වරිපනම් වාර්තාව ලබා ගැනිම. (වරිපනම් හිග මුදල් පවති නම් ගෙවා අවසන් කල යුතුය)<br>➢ කර්මාන්ත අංශයෙන් තාක්ෂණ නිලධාරි වාර්තාව ලබා ගැනීම<br>➢ කර්මාන්ත අංශයෙන් වැඩ අධිකාරි නිර්දේශය ලබාගැනීම | සියලු ලියවිලි සම්පූර්ණ විටදි පැයක් ඇතුලත නිකුත් කරනු ලැබේ. | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ➢ ලේකම්<br>➢ ආදයම් අංශයේ අංශ ප්‍රධානි<br>➢ තාක්ෂණ නිලධාරි/ වැඩ අධිකාරි<br>➢ කර්මාන්ත අංශයේ විෂය භාර නිලධාරි | වීථිරේඛා අයිතිය පිළිබඳ හා නොපවරා ගැනීමේ සහතිකපත ලබාගැනීම සදහා රු 1250.00 අය කෙරේ. |
| 21 | ජලනල එළීම සදහා මාර්ග පළුදු කිරිම. | ➢ ජාතික ජල සම්පාදන හා ජලාපවහණ මණ්ඩලය විසින් නිකුත් කරන ලද ලිපිය.<br>➢ ආදයම් අංශයෙන් වරිපනම් වාර්තාව ලබා ගැනිම. (වරිපනම් හිග මුදල් පවති නම් ගෙවා අවසන් කල යුතුය)<br>➢ කර්මාන්ත අංශයෙන් තාක්ෂණ නිලධාරි වාර්තාව ලබා ගැනිම.<br>➢ කර්මාන්ත අංශයෙන් වැඩ අධිකාරි නිර්දේශය ලබාගැනීම | සියලු ලියවිලි සම්පූර්ණ විටදි පැයක් ඇතුලත නිකුත් කරනු ලැබේ | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ➢ ලේකම්<br>➢ ආදයම් අංශයේ අංශ ප්‍රධානි<br>➢ තාක්ෂණ නිලධාරි/ වැඩ අධිකාරි<br>➢ කර්මාන්ත අංශයේ විෂය භාර නිලධාරි | පළුදු කිරීමේ ප්‍රමාණය අනුව වෙනස් වේ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| 22 | අනතුරුදායක ගසක් කපා ඉවත් කර ගැනීම | ➢ ලිඛිත ඉල්ලීම<br>➢ සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය(මෙය කර්මාන්ත  අංශයෙන් ලබා ගත හැක.)<br>➢ තාක්ෂණ නිලධාරි වාර්තාව ලබාගැනීම.<br>➢ වැඩ අධිකාරි නිර්දේශය ලබා ගැනීම.<br>➢ නීත්‍යානුකූල අවසර ලබාගත යුතු ගසක් නම් ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත් ලේඛනය | දින 14 කි | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ➢ කර්මාන්ත අංශයේ වැඩ අධිකාරි<br>➢ තාක්ෂණ නිලධාරී<br>➢ විෂය භාර නිලධාරී | අනතුරුදායක ගසක් කපා ඉවත් කර ගැනීම සඳහා පැමිණිලි යොමු කිරීම එක ගසකට රු 150.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 23 | පාරිසරික ආරක්ෂණ බල පත්‍රයක් ලබා ගැනීම. | ➢ සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය(මෙය සරප් වෙත මුදල් ගෙවීමෙන් ලබාගත හැක)<br>➢ කර්මාන්තය පිහිටි ස්ථානය දැක්වෙන මාර්ග සටහන.<br>➢ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකය.<br>➢ අදාල පළාත් පාලන ආයතනයෙන් ලබාගත් වෙළඳ බලපත්‍රය හෝ මුදල් ගෙවන ලද කුවිතාන්සියේ පිටපතක්<br>➢ අනුමත ගොඩනැඟිලි සැලැස්මේ පිටපතක්<br>➢ ඉඩමේ මිනින්දෝරු සැලැස්ම (පිඹුර)<br>➢ ඉඩමේ නිරවුල් ඔප්පු පිටපතක් හෝ ව්‍යාපාරිකයාගේ අයිතිය / භුක්තිය තහවුරු කරන ලිපි ලේඛන<br>➢ අපද්‍රව්‍ය පිරිපහදු / වායු දූෂණය / ශබ්ද දූෂණය වැලැක්වීමේ ක්‍රියාමාර්ග පිළිබද සැලැස්ම<br>➢ භූ විද්‍යා සමීක්ෂණය හා පතල් කාර්යංශයෙන් ලබා ගත් බලපත්‍ර පිටපත | දින 30 | පෙරටු කාර්යාල නිලධාරි 081-2352275 | ➢ ගරු සභාපති<br>➢ ලේකම්<br>➢ පරිසර නිලධාරි<br>➢ අංශ ප්‍රධානී සෞඛ්‍ය අංශය<br>➢ විෂයභාර නිලධාරී<br>➢ මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>➢ වැඩ අධිකාරී<br>➢ ආදායම් පරීක්ෂක | ➢ ඉල්ලුම් පත්‍රය රු 1000.00<br>➢ පරිසර නියෝගවල සඳහන් පෙරසැරි ගාස්තුව රු 3000.00<br>➢ බලපත්‍ර ගාස්තුව රු 4500.00 |

**අපගේ කැපවීම**

- අවංකව
- ප්‍රඥාවන්තව
- ආචාර සම්පන්නව
- අවබෝධයෙන් යුක්තව
- විෂය මූලිකව හා අපක්ෂපාතිව
- විනිවිදභාවයෙන් යුක්තව
- වගවීමෙන්
- අප්‍රමාදව
- කාර්යක්ෂමව හා සපලතාවයෙන්

ලබාදීමට කැපවී සිටින්නෙමු.

අපගේ අපේක්ෂාව

අප ආයතනය කෙරෙහි ඔබ තබා ඇති විශ්වාසය ගැන ඔබට ස්තුති කරන අතර ,අපගේ සේවය සඳහා ඔබ විසින් කරනු ලබන ඉල්ලීම් , යුක්ති සහගත සධාරණ සහ නියමිත කලට ඉදිරිපත් කිරීමෙන් ද,අංග සම්පුර්ණ නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමෙන් ද අපගෙන් අපෙක්ෂා කළහැකි සහ අපෙක්ෂා කළ නොහැකි දේ පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ලබාතිබීම මගින් ද ඔබට අපට සහයෝගය පළ කල හැකි බව දන්වනු කැමැත්තෙමු.

අපගේ ප්‍රමිතීන්

ඔබගෙන් ලැබෙන සෑම ලිඛිත ඉල්ලීමකටම ක්ෂණික ප්‍රතිචාර අපගෙන් ලැබෙනු ඇත.අපේ ප්‍රතිචාරය දින 07 ක් ඇතුලත දී ඔබට ලැබෙනු ඇත.ඔබේ ඉල්ලීම සමග ඉල්ලා ඇති තොරතුරු , ලිඛිත ලියකියවිලි සහ ගාස්තු ඉදිරිපත් කර ඇත්තේ නම්,ඔබ ඉල්ලා ඇති සේවය අප විසින් දැනුම් දී ඇති කාල පරාසය තුළ ඔබට ලබා දීමට අපි බැදී සිටින්නෙමු.අවසාන තීරණය ගැනීම ප්‍රමාද විය හැකි හෝ අනිවාර්යයෙන්ම ප්‍රමාද වන අවස්ථාවක දී හෝ ගැටළු සහගත තත්ත්වයක් උද්ගත වු විටක එයට හේතුව අප විසින් ක්ෂණිකව දන්වනු ලැබේ.

පැමිණිලි සහ සහන ලබාදීමේ ක්‍රමවේදය

අප ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් ආචාර සම්පන්නව,අවශ්‍ය උපකාරය හා සේවාවන් ඔබට ලබා දෙනු ලැබේ.ඉහත සඳහන් ප්‍රමිතීන් හා සම්බන්ධ ඔබට ඇති පැමිණිලි පහත සදහන් නිලධාරීන් වෙත දන්වන්න.

නම-පී.එම්.සමන්ත අරුණ කුමාර
ගරු සභාපති
ගම්පොල නගර සභාව
දුරකථන /ෆැක්ස්/ඊ-මේල් -081-2351373
urbancouncilgampola@yahoo.com

නම-යු.ජී.ජයරත්න
ලේකම්
ගම්පොල නගර සභාව
දුරකථන /ෆැක්ස්/ඊ-මේල් -081-4951277
urbancouncilgampola@yahoo.com

සියළු පැමිණිලි ලද බව දින 03 ක් ඇතුලත දන්වන අතර අවසාන පිළිතුර දින 07 ක් ඇතුළත දන්වනු ලැබේ.

සේවාලාභී මහජන ඔබෙන් ඉදිරිපත් වන යෝජනා අපි සතුටින් භාර ගනිමු.

අ. අපගේ සේවාවන් ලබන ඔබ හෝ ඔබේ නියෝජිතයින් සමඟ අප අඛණ්ඩව රැස්වීම් පවත්වනු ලැබේ. ඔබ අප සමඟ සම්බන්ධ - වීමට අපේක්ෂා කරන්නේ නම් කරුණාකර .. 081-2352275 දුරකථන අංකයෙන් අමතන්න.

ආ. මෙම ප්‍රඥප්තියට ඇතුළත් කර ඇති කරුණු පිළිබඳ ඔබේ උපදෙස් ලබා ගැනීමට හෝ ඔබේ අදහස් ලබාදීමට ඔබ දක්වන කැමැත්ත ඇතුළත් කර ඔබගේ විස්තර අපගේ WWW .................................................. ..........................................................වෙබ් අඩවියට ඇතුළත් කරන්න.

**ප්‍රඥප්තිය යටතේ ලබාදෙන ෙසේවාවන් නිරතුරුව සංශෝධනය කිරීමට සහ වැඩි දියුණු කිරීමට අපි බැදී සිටිමු.!**